## බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2009.09.24

වේලාව : පෙ.ව.11.45

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු උපසභාපති | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 07. ගරු නාගරික මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**සහභාගී නොවූවෝ :-**

| | |
|---|---|
| 01. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර | ලේකම් |

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන්නේ 2009 වර්ෂයේ සැප්තැම්බර් මස මාසික මහා සභා රැස්වීම වන අතර , ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා, ලේකම් මහතා හා පුවත්පත් කලාවේදී මහතා සාදරයෙන් පිළිගන්නා බව පැවසීය. ඉන් අනතුරුව අදහස් දැක් වූ එතුමා , බළන්ගොඩ නගර සභා බලප්‍රදේශය තුළ පදිංචි 2006/2007 , 2007/2008 අධ්‍යයන වර්ෂ වල විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබූ සිසු දරු දැරියන් 10 වෙනුවෙන් රු.5000/- බැගින් ශිෂ්‍යත්ව 10 ක් පසුගිය මස 30 වන දින ලබාදීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර තිබුණ ද නොවැලැක්විය හැකි හේතුවක් නිසා එම කාර්යය එදින සිදුකරගැනීමට නොහැකි වූ හෙයින් අද දින මෙම සභාවේ දී එම කාර්යය සිදුකිරීමට බලාපොරොත්තු වන අතර , අපගේ පාලන කාලය තුළ මෙවැනි සත් කාර්යයන් සිදුකිරීමට ලැබීම අප සියළු දෙනාගේ භාග්‍යක් වන බව පැවසීය.

ඔක්තෝබර් මස 10 වන දින පැවැත්වීමට නියමිත දකුණු පළාත් සභා මැතිවරණය දී එක්සත් ජනතා සංධානයට අතිබහුතර ඡන්ද සංඛ්‍යාවක් ලබාදෙමින් අතිගරු ජනාධිපතිතුමාට සිය

දේශපාල ගමන් මග ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන බව දන්වමින් සභාවේ ඉතිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(03) **2009.08.27 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

2009.08.27වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

## (04) පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

## 05. සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:

### 05:01 පළාත් පාලන ආයතන වල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :

ඉහත සඳහන් කරුණට අදාළව රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපති රාජා කොල්මුරේ මහතා විසින් එවා ඇති 2009.09.17 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පිහිටි වීදි වල නාම පුවරු සිංහල, දෙමළ සහ ඉංග්‍රිසී යන භාෂාත්‍රයෙන්ම සකස් කර ප්‍රකාශයකට පත් කරතිබේ නම්, ඒවායේ ලේඛන නොපමාව රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් , පළාත් පාලන ආයතනයක් විසින් සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන නියම , ප්‍රකාශන , රීති , අතුරු ව්‍යවස්ථා , නියෝග සහ නිවේදන හැර යම් ලිඛිත නීතියක් යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන සියළුම නියම , ප්‍රකාශන , රීති , අතුරු ව්‍යවස්ථා , නියෝග සහ නිවේදන ද ගැසට් පත්‍රයද ඉංග්‍රීසි පරිවර්තනයක් ද ඇතිව සිංහල හා දෙමළ භාෂා වලින් පළකරනු ලැබිය යුතු බවත් එමගින් අවධාරණය කර තිබිණ.

යථෝක්ත ලිපියෙන් කර ඇති ඉල්ලීම ඉටුකිරීමට සභාවේ එකඟතාවය පළකරන ලදී.

### 05:02 තොරතුරු තාක්ෂණය පිළිබඳ වෘත්තීය පාඨමාලාව:

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ වෘත්තීය පාඨමාලාවට මෙම කාර්යාලයේ පහත සඳහන් නිලධාරීන් දෙදෙනා සහභාගී කරවීම සඳහා අනුමැතිය පතමින් විෂය භාර නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

පාඨමාලා ගාස්තුව : ( එක් අයෙකු සඳහා ) රු.8000/- කි.

| | | |
|---|---|---|
| 01. යූ.වී.දැල බණ්ඩාර මහතා | - | වැඩ අධිකාරී |
| 02. ඒ.එම්.සී.කේ.සෙනෙවිරත්න මහතා | - | කළමනාකරණ සහකාර. |

සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් නිකුත් කර ඇති නව චක්‍රලේඛය ප්‍රකාරව , අදාළ නිලධාරීන්ගේ වැටුපෙන් 50% ක මුදලක් අයකරගැනීමටත් , ඉතිරි මුදල සභා අරමුදලින් දරා ,මෙම පාඨමාලාව සඳහා උක්ත නිලධාරීන් දෙදෙනා සහභාගීකරවීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

### 05:03 නගර සභා නිල වෙබ් අඩවියෙන් සංවර්ධන වැඩ සටහන් ප්‍රකාශයට පත්කිරීම:

මෙම නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රීවරුන් විසින් ඉටුකරනු ලබන සංවර්ධන වැඩ සටහන් /යෝජනාවන් ආදිය ජනතාව වෙත දැණුම්දීම සඳහා බළන්ගොඩ නගර සභා නිල වෙබ් අඩවියෙන් හා බ්ලොග් අඩවියෙන් අවස්ථාව සලසා දී ඇති බැවින් , අදාළ තොරතුරු ඡායා රූප සමගින් පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු වෙත ලබාදෙන ලෙස ගරු සභාව වෙත දැණුම් දෙන ලදී.

### 05:04 බළන්ගොඩ මූලික රෝහලේ පිරිමි ශල්‍ය වාට්ටුව ( වාට්ටු අංක: 08 ) අතිරේක ජල සැපයුමක් ලබාදීම

බළන්ගොඩ රෝහලේ ඉහත කී වාට්ටුවේ පැවැති ජල හිඟය මඟහරවා ගැනීම පිණිස ගරු මහින්ද රත්නතිලක ඇමතිතුමාගේ විමධ්‍යගත අරමුදල යටතේ රුපියල් 30,000/- ක වියදමින් ඉතා කෙටි කලක් තුළ අතිරේක ජල ටැංකියක් සපයා සවිකර දීරීමට කටයුතු කිරීම පිළිබඳව ස්තුතිය පිරිනමන බව දන්වමින් ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් අමතමින් මෙම සභාවේ ගරු සභාපතිතුමාට ද පිටපත් සහිතව බළන්ගොඩ මූලික රෝහලේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී එම්.බී.සී.දසනායක මහතා විසින් එවා ඇති 2009.09.17 දිනැති ලිපිය සභාගත කරන ලදී.

අදාල කර්මාන්තයේ බිල්පත් යවා මුදල් ලබාගැනීමට සභාව තීරණය කරන ලදී.

05:05 **බළන්ගොඩ නගර සභාවේ ගබඩා අංශය පරිගණකගත කිරීමේ ව්‍යාපෘති වාර්තාව**

මෙම නගර සභාවේ ගබඩා අංශය පරිගණක ගත කිරීම සුදුසු බව සඳහන් කරමින් පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු විසින් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති වාර්තාවක් සභාගත කරන ලදුව , මිළ ගණන් කැඳවා අදාළ කාර්යය නිමකරගැනිම කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

05:06 **සමෘද්ධි සංවර්ධන නිලධාරි සඳහා කාර්යාලයක් ලබාගැනීම:**

උක්ත කරුණට අදාළව ප්‍රාදේශීය ලේකම්,බළන්ගොඩ විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ නගර වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරී කාර්යාලය පවත්වාගෙන යාමට ස්ථානයක් නොමැති නිසා සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ නිවෙස් වල කාර්යාලය පවත්වාගෙන යන අතර රාජකාරී කටයුතු ඉටුකිරිමේ දී නොයෙකුත් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවන බව අදාල නිලධාරිණිය දැණුම් දී ඇති බැවින්, සමෘද්ධි සංවර්ධන නිලධාරි කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා සුදුසු ස්ථානයක් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා ඇති බව සභාව වෙත දැණුම් දෙන ලදී. බළන්ගොඩ නව බස්නැවතුම්පලේ උඩු මහලේ විවේක කාමරයක් එක් වර්ෂයක් සඳහා( මෙම වර්ෂයේ මාස 03 ද ඇතුළත්ව ) ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:07 **ස්තුතිය පළකිරීම:**

සබරගමුව පළාත් සභාවේ ගරු නියෝජ්‍ය සභාපති රංජිත් බණ්ඩාර මැතිතුමාගේ දයාබර පියාණන්ගේ අවමංගල්‍ය උත්සවයට නන් අයුරින් සහාය හා දායකත්වය සැපයීම පිළිබඳව තමාගේ සහ තම පවුලේ සාමාජිකයන්ගේ ස්තුතිය හා කෘතඥතා පළකරන බව දන්වමින් එතුමා විසින් එවා ඇති ලිපියක් ගරු සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

05:08 **හිඟ දුරකථන ගාස්තු අයකිරීම**

බළන්ගොඩ නගර සභාව නමින් ලබාගෙන ඇති අංක: 060-2455750 දරණ ගරු විමලසේන මන්ත්‍රීතුමාට අයත් දුරකථනය සඳහා 2006.09.12 දින සිට මේ දක්වා රු.48,389.54 ක මුදලක් ගෙවීමට ඇති අතර මේ සම්බන්ධව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව දුරකථනය විසන්ධි කල කාල සීමාවේ දී අයකල ස්ථාවර ගාස්තු ඉවත් කිරීමට එකඟ වූ අතර , ඒ අනුව , රු.46,235.89 ක මුදලක් අවසාන වශයෙන් ගෙවීමට සිදුවන බවත් , එමෙන්ම , මෙම හිඟ මුදල ගෙවීමට අපොහොසත් වන්නේ නම්, නගර සභාව නමින් ඇති සියළුම දුරකථන විසන්ධි කිරීමට සිදුවන බව ඔවුන් විසින් දන්වා ඇති බව සඳහන් කරමින් මෙම හිඟ දුරකථන ගාස්තු අයකිරීම සම්බන්ධව සභාවේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා ගණකාධිකාරී මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සලකා බැලු සභාව අදාල මුදල සභා අරමුදලින් ගෙවා , එම මුදල ගරු මන්ත්‍රීවරයාගෙන් දීමනාවෙන් 50% බැගින් අඩුකිරීමටත් තීරණය කරන ලදී.

**05:09 ක්‍රෙඩිට් කාඩ්පත් හා ඩෙබිට් කාඩ්පත් මගින් පාරිභෝගිකයන්ට / බදුකරුවන්ට මුදල් ගෙවීමේ පහසුකම් සැලසීම**

නගර සභාවට අයවිය යුතු වරිපනම් හා අනෙකුත් ගාස්තු ගෙවීමට පැමිණෙන ඇතැම් පාරිභෝගිකයන් / බදුකරුවන් ක්‍රෙඩිට්/ඩෙබිට් කාඩ්පත් මගින් ගෙවීමේ හැකියාව විමසා ඇත.
මෙම තාක්ෂණය ලබාගැනීමේ දී අදාල බැංකුව විසින් තාක්ෂණික මෙවලම් නොමිළේ සපයන අතර, මෙම නගර සභාව විසින් ගනුදෙණුකරුවන්ගේ/බදුකරුවන්ගේ ක්‍රෙඩිට්/ඩෙබිට් කාඩ්පත් මගින් අයකර ගන්නා වටිනාකමින් 3% කොමිස් මුදලක් අදාළ බැංකුව වෙත ගෙවිය යුතු වන බැවින් , මෙම තාක්ෂණික පහසුකම ලබාගනිමින් ආදායම් එකතුකර ගැනීමේ ප්‍රගතිය වැඩිකිරීම සඳහා අවධානය යොමු කරන ලෙස ඉල්ලමින් ගණකාධිකාරී මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව , ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව ඉහත තාක්ෂණික පහසුකම් ලබාදීම සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:10 **භාවිතයට නොගන්නා ළිඳක් වසා දැමීම:**

උක්ත කරුණට අදාළව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් යොමු කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ , නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි පරණ පාර කුසුම්සිරි මෝටර්ස් ආයතනයට යාබඳව ඇති පොදු ළිඳ වර්ෂ ගණනාවක් සිට භාවිතයට නොගෙන අත්හැර දමා ඇති අතර, මෙම ළිඳ පොදු ළිඳක් වන නමුත් එහි අද දක්නට ඇත්තේ ටින් , බෙලෙක්ක සහ අපද්‍රව්‍ය වන බැවින් එය භාවිතයට සුදුසු තත්ත්වයක නොමැත. මේ සම්බන්ධව බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ඩෙංගු මර්ධන ඒකකය විසින් ජල සාම්පල් පරීක්ෂා කර එහි මදුරු කීටයන් සිටින බවද දන්වා ඇති බව සඳහන් කරමින් මෙම ළිඳ ප්‍රයෝජනයට නොගන්නා ළිඳක් වන බැවින් , වසා දැමීමත් ඉඩම ආරක්ෂා කිරීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් ගැනීම සුදුසු බවත් යෝජනා කර තිබුණි.

සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම් බළන්ගොඩ වෙත දැණුම් දීමට සභාව තීරණය කරන ලදී.

05:11 **රත්නපුර සිවිල් අභියාචනා මහාධිකරණ නඩු අංකඃHCCA 16/2009**

උක්ත අංක දරණ නඩුව 2009/09/15 වන දින කැඳවන ලද අවස්ථාවේ දී අධිකරණය විසින් මෙම නඩුව නිෂ්ප්‍රභා කරන ලද බව දන්වන අතර, මෙම නඩුවේ ලිඛිත දේශන හා අනෙකුත් ලියවිලි සකස් කිරීම වෙනුවෙන් හා සියළුම පෙනී සිටීම් සඳහා රු.100,000/- ක

මුදලක් තමා වෙත ලබාදෙන ලෙස ඉල්ලා නීතීඥ ඩබ්.දයාරත්න මහතා විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

අදාල මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදුන් අතර, මෙම සභාවට අදාළව බළන්ගොඩ අධිකරණයේ පවතින 3080 අංක දරණ නීතිකෘත්‍ය සඳහා නීතීඥ දයාරත්න මහතාම ඉදිරියට ද සම්බන්ධ කරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:12 **තාවකාලික (කූඩාරමක් ) හා පුටු ලබාගැනීමඃ**

බළන්ගොඩ ප්‍රදේශයේ ඉතා දුෂ්කර ගම්මානයක් වන වලේබොඩ ජනතාවගේ හිත සුව පිණිස 2009.09.20 වන දින නොමිළයේ සායනයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බැවින් , ඒ සඳහා නගර සභාව සතු තාවකාලික කූඩාරමක් ( හට් එක ) ලබාදෙන ලෙස ඉල්ලා විශ්‍රාමලත් විදුහල්පති සාම විනිසුරු වලේබොඩ ගුණවර්ධන මහතා විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදුව, මෙම ප්‍රදේශය නගර සභා බලප්‍රදේශයට අයත් නොවන බැවින්, අදාළ ඉල්ලීම ඉටුකල නොහැකි බව දැණුම් දීමට සභාව තීරණය කරන ලදී.

05:13 **පොහොර ඇසුරුම් කිරීම සඳහා ඇසුරුම් ලබාගැනීම :**

බළන්ගොඩ නගර සභාව විසින් නිෂ්පාදනය කරනු ලබන " U.C.B " කාබනික පොහොර ඇසුරුම් කිරීම සඳහා 2 kg ප්‍රමාණයෙන් බෑග් 10000 ක් හා , 5 kg ප්‍රමාණයෙන් බෑග් 10000 ක් Hidencity Polythine වලින් නිෂ්පාදනය කරන බෑග් ප්‍රමාණයන් ලබාගැනීමට අනුමැතිය පතමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව , මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදුන් අතර, " U.C.B " කාබනික පොහොර කිලෝ 5000 ක් වැනි ප්‍රමාණයක් මිළදී ගන්නා අයට කිලෝ 01 රු.6/- ක සහනදායී මිළකට ලබාදීමට තීරණය කරන ලදී.

05:14 **2010 වර්ෂය සඳහා මස්කඩ ටෙන්ඩර් කිරීමඃ**

උක්ත කරුණට අදාළව විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති 2009.09.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙම නගර සභාව විසින් 2009 වර්ෂය සඳහා ටෙන්ඩර් ලබා දී ඇති (නගර සභාව සතු ) පොදු වෙළඳසැල අංකඃ15 එළු මස් කඩය , අංකඃ 16 එළහරක් මස් කඩය හා අංකඃ17 කුකුල් මස් කඩය 2009.12.31 දිනෙන් ටෙන්ඩර් කාලය අවසන් වන බැවින් , 2010 වර්ෂය සඳහා ටෙන්ඩර් කල යුතුව ඇති නිසා , 2010 වර්ෂයට අවම ලංසුව තීරණය කරගැනීම , පුවත්පත් දැන්වීම් හා අන්තර් ජාලයේ දැන්වීම් පළකිරීම , අදාළ කොන්දේසි තීරණය කිරීම හා ටෙන්ඩර් විවෘත කිරීමේ දිනය තීරණය කිරීම ආදී කටයුතු සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව , පොදු වෙළඳසල මස් කඩ සඳහා පසුගිය වර්ෂයේ ලංසුව , අවම ලංසුව සේ සලකා ඉදිරි වර්ෂය සඳහා ටෙන්ඩර් කැඳවීමටත් , ඉතිරි මාළු සහ එළවළු කඩ ද ඇතුළුව සියළුම කඩ සඳහා දැනට අයකරනු ලබන වාර්ෂික කුළිය අවම ලංසුව ලෙස සලකා ටෙන්ඩර් කිරීමටත් , මෙම ටෙන්ඩර් ඔක්තෝබර් මස මහ සභා රැස්වීමේ දී විවෘත කිරීමටත් තීරණය කරන ලදී. අදාළ ටෙන්ඩර් දැන්වීම් පුවත්පත් මගින් හා අන්තර්ජාලයේ පළකිරීම මගින් ප්‍රසිද්ධ කරවීමටත් අනුමැතිය ලබාදෙන ලදී.

05:15 **ධීවර සංස්ථා ජංගම මසුන් අලෙවි කටයුතු සඳහා පළාත් පාලන ආයතනවල අවසර ලබාගැනීම :**

අතිගරු ජනාධිපතිතුමාගේ " මහින්ද චින්තනය " අනුව පාරිභෝගික ජනතාවට ගුණාත්මක තත්ත්වයේ මසුන් සාධාරණ මිළකට අලෙවි කිරීමේ ප්‍රතිපත්තිය යටතේ ලංකා ධීවර සංස්ථාව විවිධ ප්‍රදේශවල ආයතන/නගර සභා /ප්‍රාදේශීය සභා මාර්ගයෙන් මසුන් අලෙවි කටයුතු ව්‍යාප්ත කිරීමට කටයුතු කරමින් සිටින බැවින් , මෙම නගර සභා බල ප්‍රදේශය තුළ ද ලංකා ධීවර සංස්ථාවේ ජංගම මසුන් අලෙවි කිරීම සඳහා පූර්ණ අනුග්‍රහය ලබාදෙන ලෙස ඉල්ලා ලංකා ධීවර සංස්ථාවේ සභාපති විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී. දැනට මෙම සභාව විසින් සැලසුම් සහගතව ඉරිදාපොළක් ඉදිකරන බැවින් , එය ඉදිකර අවසන් වූ පසු අවශ්‍ය පහසුකම් සැලසිය හැකි බව තීරණය වූ බවත්, ඒ අනුව දැනට ඉහත ඉල්ලීම ඉටුකළ නොහැකි බවත් දැණුම් දීමට සභාව තීරණය කරන ලදී.

05:16 **ලෙජර් ගිණුම් පරිගණක ගතකිරීම - පුහුණු වැඩ මුළුව :**

මෙම නගර සභාවේ ගණකාධිකාරී, ව්‍යාපෘති සමායෝජක ඒ. රජිති කොස්වත්ත, හා පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු එච්.ඒ.ජී.සංකල්ප ප්‍රේමදාස යන නිලධාරීන් ලෙජර් ගිණුම් පරිගණක ගතකිරීමේ පුහුණුව වැඩ මුළුවට සහා අරමුදලින් රු.25000/- ක මුදලක් ගෙවා සහභාගීකරවීමට අනුමැතිය පතමින් විෂය භාර නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව , ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06 **මුදල් ගෙවීම් අනුමත කිරීම :** ( රු.10,000/- ට වැඩි ගෙවීම් )

## 2009.08.21 සිට 2009.09.16 දක්වා රු.10000/= ට වැඩි ගෙවීම් පොදු ගිණුම

| දිනය | විස්තරය | ව.අ. | චෙ.අ. | මුදල |
|---|---|---|---|---|
| | | | | |
| 09.08.21 | **සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා සමිතිය**<br>තානායම අලුත් වැඩියාව සඳහා සිමෙන්ති මිටි 50ක් මිලදී ගැනීම<br>750X50 = 37,500.00 | 57 | 638196 | 37,500.00 |
| | **සභාපති සුහද ග්‍රාම සංවර්ධන සමිතිය**<br>වැලිහරනාව ජල ටැංකිය පාර කොන්ක්‍රීට් කිරීම කර්මාන්තය . පළමු කොටස ගෙවීම.<br>ඇස්තමේන්තු මුදල - 446,841.52<br>අඩුකලා ශ්‍රමදායකත්වය - 89,457.67<br>10% රැඳවුම් - 35,738.38<br>අත්තිකාරම් - 100,000.00 | 58 | 638197 | 221,645.47 |
| | **සභාපති කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය**<br>මුගුණමලේ පාර උඩහගම පාර සම්බන්ධ පාර කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ අත්තිකාරම් මුදල් ගෙවීම | 59 | 638198 | 100,000.00 |
| | **තාවකාලික වැටුප් - සෞඛ්‍ය අංශය**<br>නගරයේ ප්‍රධාන කානු වැලිගොඩ දැමීම . 2009.08.06 සිට 2009.08.21 | 60 | 638,199 | 10,500.00 |
| 09.08.25 | **ඉන්දික එරික් සිසිල්**<br>තානායම අලුත් වැඩියාව වෙනුවෙන් ගඩොල් 5000ක් ලබා ගැනීම | 61 | 638227 | 27,500.00 |
| | **සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය**<br>2009 ජූලි මස විදුලිබිල<br>ළදරු පාසල - 3,633.00<br>පුස්තකාලය - 3,009.00<br>ආයුර්වේදය - 396.00<br>තොරතුරු තාක්ෂණ ඒකකය - 318.00 | 63 | 638228 | 11,398.50 |

| | | | | |
|---|---|---|---|---|
| | විදුණැන පියස - 4,042.50<br>11398.50<br>- 6 - | | | |
| | **සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය**<br>2009 ජූලි මස විදුලිබිල<br>පොදු වෙළඳසැල - 10,302.00<br>ප්‍රේක්ශකාගාරය - 435.00<br>තානායම් නිල නිවාස - 117.00<br>තානායම - 240.00 | 64 | 638228 | 11,094.00 |
| 09.08.25 | **සාමාන්‍යාධිකාරී. ලංකා විදුලිබල මණ්ඩලය**<br>2009 ජූලි මස විදුලි බිල<br>කාර්යාලය - 17,595.00<br>යාබද ගොඩනැගිල්ල - 1,215.00 | 66 | 638228 | 18,810.00 |
| | **දේශීය ආදායම් කොමසාරිස්**<br>2009 ජූනි මස රදවා ගැනීමේ බදු දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේශණය කිරිම. | 67 | 638229 | 43,741.02 |
| | **සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා සමිතිය**<br>2009.07.11 - 2009.07.18 දක්වා ඉන්ධන බිල පියවීම<br>**වර්ගය ඒකකමිල ප්‍රමාණය මුදල**<br>ඩීසල් ලී.1 73.20 584 42,748.80<br>හයිඩ්‍රොලික් 5කෑන් 1620 01 1,620.00<br>එන්ජින් ඔයිල් 257 01 257.00<br>ගියර් ඔයිල් ලී. 6.5 කෑන්1972 01 972.00<br>පැට්‍රල් 130.20 56 7291.20<br>ටූ.ටී.1/2 ලීටර් 145 01 145.00 | 68 | 638230 | 54,034.00 |
| | **සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා සමිතිය**<br>2009.07.09 - 2009.07.10 දක්වා ඉන්ධන බිල පියවීම<br>**වර්ගය ඒකකමිල ප්‍රමාණය මුදල**<br>ඩීසල් ලී.1 73.20 340 24,888.00<br>එන්ජින් ඔයිල් 257 1 257.00<br>පැට්‍රල් 130.20 56 2,604.00 | 69 | 638230 | 27,749.00 |
| 09.08.25 | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>දුරකථන බිල පියවීම දු.අ.87299 බළන්ගොඩ තානායම 2009 ජූලි දක්වා හිඟ මුදල් පියවීම. | 70 | 638231 | 18,041.24 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>දුරකථන බිල පියවීම - 2009 ජූලි<br>දු.අංක මුදල<br>2452931 - 6779.87<br>2452932 - 3325.44 | 71 | 638231 | 10,105.31 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>දුරකථන බිල 2009 ජූලි<br>2287275 - 7,093.46<br>2287153 - 6,435.97<br>2286596 - 5,047.95<br>2288737 - 7,573.42<br>ඊ-මේල් - 230.92 | 72 | 638231 | 26,381.72 |
| 09.08.26 | **එච්.එල්.ඩබ්.එන්ට්‍රප්‍රයිසස්**<br>ප්‍රිමික්ස් නිශ්පාදනය වෙනුවෙන් භූමිතෙල් ලී.200ක් ගැනීම<br>ලී.200 x 51/20 = 10,240.00 | 73 | 638233 | 10,240.00 |
| 09.08.26 | **එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස්**<br>තානායම අලුත්වැඩියාව සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය ලබා ගැනිම | 74 | 638234 | 42,225.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| | **රිචඩ් ප්‍රැන්සිස්**<br>ප්‍රිමික්ස් නිශ්පාදනය හා තානායම අලුත්වැඩියාව වෙනුවෙන් වැලි කියුබ් 06ක් ලබා ගැනීම<br>6 X 3,750.00 = 22,500.00 | 75 | 638235 | 22,500.00 |
| 09.08.28 | **කළමණාකරු , ජල සම්පාදන මණ්ඩලය**<br>2009 අගෝස්තු මස ජලබිල පියවීම<br>පොදු වෙළඳසැල - 11,911.20<br>පිංතාලිය - 992.32<br>තානායම - 1,231.20 | 78 | 638237 | 14,134.72 |
| | **එස්.මනෝහරන්**<br>මහජන පුස්තකාලයට හා කියවීම් ශාලාවට පුවත්පත් මිළදී ගැනීම | 79 | 638238 | 10,410.00 |
| | **2009 සැප්තැම්බර් මාසය** | | | |
| 09.09.01 | **මුදල් භාරකරු , ශාන්ත අබේසේකර**<br>දසමස් වැටුප් අත්තිකාරම් මුදලින් කොටසක් ගෙවීම. | 01 | 238256 | 96,144.54 |
| | **සෙනොක් ට්‍රේඩ් කම්බයින් ලිමිටඩ්**<br>HF 7899 JCB යන්ත්‍රයේ අලුත් වැඩියාව සඳහා අමතර කොටස් මිලදී ගැනීම | 02 | 238257 | 151,390.40 |
| 09.09.02 | **බී.ගුණරත්න**<br>2009.8.15 සිට 2009.8.31 දක්වා නගරයේ කසල එකතු කිරීම හා ප්‍රවාහණය කිරීම සඳහා කම්කරුවන් යෙදවීම. | 04 | 238259 | 86,708.00 |
| | **තාවකාලික වැටුප් - කර්මාන්ත**<br>2009 අගෝස්තු මස 17 සිට 31 දක්වා තාවකාලික වැටුප් ගෙවීම හා මේසන්, වඩු කාර්මික, පින්තාරු කිරීම සඳහා හා<br>➢ කහටපිටිය පාර ශුද්ධ කිරීම<br>➢ බැංකියවත්ත අතිරේක ටැංකිය ඉදිකිරීම<br>➢ කුමාරගම පාර ශුද්ධ කිරීම<br>➢ තානායම අලුත් වැඩියාව | 05 | 238260 | 148,750.00 |
| 09.09.02 | **තාවකාලික වැටුප් - ආදායම්**<br>2009.08.24 සිට 2009.08.31 දේපල තක්සේරු කිරීමේදී සහායකයින් සඳහා<br>(2009.08.27 සභා තීරණය පරිදි) | 05 | 238260 | 24,000.00 |
| | **ඉන්දික එරික් සිසිල්**<br>BMICH හි පැවැත්වූ ප්‍රදර්ශනය වෙත 2009.08.17 දින භාණ්ඩ ප්‍රවාහනය කිරීම හා 2009.08.20 ආපසු ගෙනඒම සඳහා. | 06 | 638261 | 28,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 09.09.08 | **සාමාන්‍යාධිකාරී. ඉඹුල්පේ විවිධසේවා සමිතිය**<br>2009.07.20 - 2009.07.27<br>ඉන්ධන බිල පියවීම<br>වර්ගය ඒකකමිල ප්‍රමාණය මුදල<br>ඩීසල් ලී.1 73.20 822 60,170.40<br>එන්ජින් ඔයිල් 360 01 360.00<br>එන්ජින් ඔයිල් 257 01 257.00<br>පැට්‍රල් 130.20 57 7,421.40<br>68,208.80 | 12 | 638264 | 68,208.80 |
| | **සාමාන්‍යාධිකාරී. ඉඹුල්පේ විවිධසේවා සමිතිය**<br>2009.07.27 - 2009.07.31<br>ඉන්ධන බිල පියවීම<br>වර්ගය ඒකකමිල ප්‍රමාණය මුදල<br>ඩීසල් 73.20 755 55,266.00<br>එන්ජින් ඔයිල් 257 02 514.00<br>එන්ජින් ඔයිල් 713 01 713.00<br>ග්‍රීස් කි.ග්. 459 250ග්. 114.75<br>පැට්‍රල් 130.20 26 3,385.20<br>ටූ.ටී. 1/2 115.00 01 115.00<br>හයිඩ්‍රොලික් 10ලී.කෑන් 5867 02 11,734.00 | 13 | 638264 | 71,841.95 |
| | **LECC මෙටල් ක්‍රෂර්**<br>කර්මාන්ත අංශයට හා ප්‍රිමික්ස් සඳහා ගල් ලබා ගැනීම<br>ප්‍රමාණය ඒකකමිල මුදල<br>3/4 - කියුබ් - 01 - 4800.00 4,800.00<br>1/2 - කියුබ් - 05 - 3300.00 16,500.00<br>6X9 - කියුබ් - 0.88 - 2300.00 2,024.00<br>4X4 - 1.88 - 4000.00 7,520.00<br>1 1/2- 01 - 4400.00 4,400.00 | 21 | 638270 | 35,244.00 |
| | **දේශීය ආදායම් කොමසාරිස්**<br>2009.07.08 අංක 25 දරණ වවුචර පතට (දේවි ට්‍රැක්ටර් සමාගමට) හිමි VAT 1/3 ගෙවීම. | - | 638271 | 20,715.94 |
| | **එම්.ජී.පියසේන**<br>2009.08.12 - 2009.09.07 දක්වා බස්ගාල් ගාස්තු 15% තැන්පත් ගෙවීම | 22 | 638272 | 18,000.00 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>දුරකථන බිල - 2009 ජූලි<br>2287023 3,520.00<br>2452939 3,300.88<br>2287022 2,806.04<br>2288565 444.15<br>2287024 2,753.26<br>2452932 2,180.01<br>2452931 3,231.73<br>2288400 3,371.29 | 24 | 638274 | 21,607.37 |
| 09.09.08 | **සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා සමිතිය**<br>බළන්ගොඩ තානායම , බැංකියවත්ත මල ප්‍රතිකාරක පද්ධතිය, මෝටර් යොදා වැසි ජලය පොම්ප කිරීම, කර්මාන්ත වලට සිමෙන්ති සඳහා<br>745X 75 = 55,875.00 | 26 | 638276 | 55,875.00 |
| 09.09.11 | **ප්‍රසන්න කුෂන් වර්ක්ස්**<br>56 - 1906 කෘෂ කැබ් රථයේ සීට් අලුත් වැඩියාව සඳහා | 29 | 638278 | 13,950.00 |
| | **H.F. සුපුන් ජානක ෆොන්සේකා**<br>තානායම සඳහා කොස්දැව ලබාගැනීම<br>ප්‍රමාණය ඒකකමිල මුදල<br>3 X4 දිග 6 = 22<br>3 X4 දිග 5 = 24<br>1 X4 දිග 6 = 22<br>1 X4 දිග 4 = 40 | 30 | 638279 | 80,080.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1 x4 දිග 5 = 35 | | | |
| | **ඩැක්ස් ඉංජිනියරින් කොම්පැනි පුද්ගලික සමාගම**<br>බොබ්කැට් යන්ත්‍රයේ මීටර් පැය 1250 සේවාව වෙනුවෙන්. | 32 | 638281 | 28,314.05 |
| 09.09.11 | **ජෝති ස්ටෝර්ස්**<br>කාර්යාලයට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් ද්‍රව්‍ය ලබා ගැනිම. | 34 | 638283 | 37,566.00 |
| | **LECC මෙටල් ක්‍රෂර්**<br>ප්‍රිමික්ස් නිශ්පාදනය හා තානායම සඳහා ගල් ලබා ගැනීම.<br>ප්‍රමාණය ඒකකමිල මුදල<br>1/2 ගල් 6 x 3,300.00 19,800.00<br>6 x 9 ගල් 5 x 2,300.00 11,500.00<br>3/4 ගල් 01 x 4,800.00 4,800.00<br>1 1/2 ගල්03 x 4,400.00 13,200.00 | 35 | 638284 | 49,300.00 |
| | **හර්ෂණ කලර් සෙන්ටර්**<br>තානායම අළුත්වැඩියාව වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම. | 36 | 638285 | 31,804.92 |
| | **ජේ.එෆ්.ඩිස්ට්‍රිබියුටර්ස්**<br>බළන්ගොඩ , ඕලුගංතොට රෝහල සඳහා ජල සැපයුම් උපාංග හා තානායම ජල සැපයුම අලුත්වැඩියාව සඳහා උපාංග මිලදී ගැනීම. | 37 | 638286 | 27,322.50 |
| 09.09.16 | **වජිර සංජීව විජේකෝන්**<br>BMICH හි පැවති පළාත් පාලන අයතන ප්‍රදර්ශණය සඳහා ප්‍රදර්ශන කුටිය ඉදිකිරීම. | 39 | 638296 | 62,500.00 |
| | **2009.09.07 සිට 2009.09.11 දක්වා ලංකා බැංකු ගිණුම** | | | |
| 09.09.07 | **දේශීය ආදායම් කොමසාරිස්**<br>බැංකියවත්ත කසල කළමනාකරණ මධ්‍යස්ථානය පොලොව කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ VAT 1/3 දේශීය ආදායම් කොමසාරිස් වෙත යැවීම. | 01 | 800654 | 31,365.76 |
| | **සෙනුර සිවිල් ඉංජිනියරින් පුද්ගලික සමාගම**<br>බැංකියවත්ත කසල කලමනාකරන මධ්‍යස්ථානය පොලොව කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ රැඳවුම් ගෙවීම. | 01 | 800656 | 828,683.00 |
| 09.09.08 | **සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය**<br>2009 අගෝස්තු මාසයේ විදුලි බිල පියවීම | 02 | 800657 | 54,882.00 |
| 09.09.11 | **සාමාන්‍යාධිකාරී, ජල සම්පාදන මණ්ඩලය**<br>2009 අගෝස්තු මාසයේ විදුලි බිල පියවීම. | 03 | 800658 | 76,203.60 |
| | **දේශීය ආදායම් කොමසාරිස්**<br>වවුචර් 01 හා 2009.08.03 වවුචර් පතට VAT 1/3 ගෙවීම. | | 800659 | 301,891.80 |

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

07. **ඇස්තමේන්තු අනුමත කිරීම :**

07:01 "දේගපිටිය පාර අලුතින් ඉදිකල පාලම අසල බැම් බැඳ කාණු සාදා බාධාවකින්තොරව ජලය ගලායාමට සැකසීම " කර්මාන්තයේ අයිතම අංකඃ 03 සඳහා ඒකක මිළ වශයෙන් යොදා ඇත්තේ 1606.43 කි.

නමුත් එම මුදල රු.16006.43 ක් විය යුතු බැවින් ඇස්තමේන්තුව සංශෝධනය කර සභා අනුමැතිය ඉදිරිපත් කර තිබුණි. අදාල සංශෝධනය සිදුකිරිමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

07:02 බෝමිබුව පරගහකුඹුර ක්‍රීඩාපිටිය වටා බැම් බැඳ දැල් ආවණය කිරීම කර්මාන්තය රු.537558.76

මෙම කර්මාන්තයේ ඇස්තමේන්තුව සභාව විසින් අනුමත කරන ලදී.

08. **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ :**

නැත.

**යථා පරිදි කල් දී ඇති යෝජනා :**

නැත

09. **ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම:**

09:01 **56/1906 කෘෘ කැබ් රථයේ ඇන්ජිම නැවත අළුත්වැඩියා කිරීම:**

මෙම නගර සභාව සතු කෘෘ කැබ් රථයේ ඇන්ජිම නැවත අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර අදාල මිළ ගණන් පහත දැක්වේ.

| තිලංක මෝටර් සප්ලයි , 158/2 පංචිකාවත්ත , කොළඹ 10 | ජයමාන්න මෝටර්ස් , 158/ඒ, පංචිකාවත්ත , කොළඹ 10 | සඳමාලී ඔටෝ සප්ලයර්ස් 183/6 , සුමතිපාල බිල්ඩින් , කොළඹ 10 | ගාමිණී ඔටෝ ඉංජිනියර්ස්, බළන්ගොඩ |
|---|---|---|---|
| රු.36,750/- | රු.37,000/- | රු.38,900/ | රු.35,750/- |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් අවම මිළ ගණන වු රු.35,750/-ක මිළ (ගාමිණී ඔටෝ ඉංජිනියර්ස්, බළන්ගොඩ ) ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:02 **56/1906 කෘෘ කැබ් රථය පින්තාරු කිරීම :**

ඉහත අංක දරණ රථයේ දිරා ගිය තැන් අළුත්වැඩියා කර පින්තාරු කර ටෙන්ට් එක අළුත්වැඩියා කිරීම සඳහා ලැබී තිබු මිළ ගණන් පහත දැක්වේ.

| ගාමිණී ඔටෝ ඉංජිනියර්ස් | රත්න ඉංජිනියර් වර්ක්ස් | නිරේෂා මෝටර්ස් |
|---|---|---|
| රු.77,709/- | රු.85,000/- | රු.95,000/- |

ඉහත මිළ ගණන් අතරින් " ගාමිණී ඔටෝ ඉංජිනියර්ස් " ආයතනයේ අවම මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:03 **Point Card 10000 ක් මුද්‍රණය කිරීම :**

මෙම නගර සභාව මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත , පාසල් 05 ක දිරි නොයන අපද්‍රව්‍ය වෙන් කර එකතු කිරීමේ වැඩ සටහනට අවශ්‍ය කරන Point Card 10000 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් කැඳ වු මිළ ගණන් පහත දැක්වේ.

| අයිතමය | සිගිරි ප්‍රින්ටර්ස් | සසිත ප්‍රින්ටර්ස් | නිව් පුන්සඳ මුද්‍රණ |
|---|---|---|---|
| A 5 ප්‍රමාණයේ සුදු බ්‍රිස්ටල් බෝඩ් වල තනි වර්ණයෙන් දෙපැත්ත ( ලබාදුන් ආකෘතිය අනුව ) Point Card 10000 ක් මුද්‍රණය කිරීම | රු.30,000/- | රු.32,500/- | රු.39,000/- |

අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති " සීගිරි ප්‍රින්ටර්ස් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති මිළ ගණන සභාව විසින් පිළිගන්නා ලදී.

09:04 **ඉලෙක්ට්‍රොනික් තරාදියක් මිළදී ගැනීම :**

බළන්ගොඩ නගර සභාවේ සම්පත් කේන්ද්‍රය සඳහා ඉලෙක්ට්‍රොනික් තරාදියක් මිළදී ගැනීම වෙනුවෙන් කැඳ වූ මිළ ගණන් පහත දැක්වේ.

| අයිතමය | W.M.International ( Pvt ) Ltd | " NEAT " Oluganthota Balangoda | Weight Master | Ceylon Business Elevation |
|---|---|---|---|---|
| ඉලෙක්ට්‍රොනික් ලොකු තරාදිය 01 ( 300 Kg x 50 g ) | රු.48,000/- | රු.56,900/- | රු.59,000/- | රු.63,000/- |

අවම මිළ ඉදිරිපත් කර ඇති W.M.International ආයතනයේ මිළ ගණන පිළිගන්නා ලදී.

09:05 **Laptop පරිගණකයක් මිළදී ගැනීම:**

මෙම නගර සභාවේ ප්‍රයෝජනය සඳහාත් දේශන වලදී හා පුහුණු වැඩ මුළු ආදිය සඳහාත් ප්‍රයෝජනයට ගැනීමට **Laptop** පරිගණකයක් මිළදී ගැනීම වෙනුවෙන් කැඳ වූ මිළ ගණන් පහත දැක්වේ.

| අයිතමය | Jaan Computers Services | DJ Computers | Wisdom Tecnologies |
|---|---|---|---|
| Compaq Cq 6o වර්ගයේ Lap Top පරිගණක 01 | 80,500/- | 85,000/- | 85,000/- |

අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති JaanComputers Services වෙතින් අදාල පරිගණකය ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:06 **තානායම අලුත්වැඩියාව කිරීම සඳහා භාණ්ඩ මිළදී ගැනීම**

මෙම නගර සභාව මගින් පාලනය කරනු ලබන තානායම අලුත්වැඩියාව වෙනුවෙන් අවශ්‍ය කරන ද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් කැද වූ මිළ ගණන් පහත දැක්වේ.

| | දේශානී හාඩ්වෙයාර් | සේනානී හාඩ්වෙයාර් | නිව්හැපි ස්ටෝර්ස් | ජගත් එන්ටර්ප්‍රයිසස් | එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර් |
|---|---|---|---|---|---|
| කොමඩ් සෙට් 02 | 24,000/- | 24,800/- | 24900/- | 24,550/- | 24,650/- |
| බිඩ් ෂවර් 08 | 5,400/- | 5,520/ | 5,560/- | 5,480/ | 5,600/- |
| පෙක්සිබල් හෝස් 20 | 4,000/- | 4,200/- | 4,300/- | 4,200/- | 4,200/- |
| ඇන්ගල් වැල් 1/2" 14 | 8,260/ | 8,400/- | 8,680/- | 8,568/- | 8,610/- |
| නිකල් කරාම 1/2" 18 | 27,000/- | 29,700/- | 30,150/- | 28,800/- | 28,350/- |
| නිකල් ෂවර් 1/2" උණු වතුර 06 | 7,800/- | 80,404- | 8,040/- | 7,920/- | 7,950/- |
| ගලී කවර ( සුදු ) 08 | 1,200/- | 1,280/- | 1,360/- | 1,232/- | 1,240/- |
| 1 1/2" වෝල් ප්ලග් 20 | 20/- | 20/- | 30/- | 20/- | 20/- |
| 1 1/2"x8 ඉස්කුරුප්පු ඇණ 20 | 240/- | 300/- | 300/- | 240/- | 300/- |
| 1/2" බේසන් ටැප් 07 | 9,100/- | 9,450/- | 9,660/- | 9,275/- | 9,415/ |
| 1" ක්‍රෙඩ් සීල් 05 | 200/- | 225/- | 200/- | 200/- | 225/- |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1/2 " ක්‍රෙඩ් සීල් 05 | 50/- | 60/- | 50/- | 50/- | 60/- |
| 1" නන්රිටන් වැල් 01 | 375/- | 385/- | 395/- | 380/- | 385/- |
| ටයිල් ක්ලීනර් කෑන් 01 | 510/- | 525/- | 530/- | 515/- | 520/- |
| බේසන් ඇණ පැකට් 04 | 340/- | 360/- | 380/- | 340/- | 350/- |
| උණුවතුර බට ලෙන්ත් 03 | 2025/- | 2070/- | 2100/- | 2370/- | 2040/- |
| උණුවතුර T ජොයින්ට් 08 | 5200/- | 5320/- | 5360/- | 5280/- | 5280/- |
| උණු වතුර එල්බෝ 20 | 1100/- | 1300/- | 1400/- | 100/- | 1200/- |
| ගම් උණු වතුර සඳහා 02 | 1200/- | 1230/- | 1220/- | 1200/- | 1220/- |

අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති දේශානී හාඩ්වෙයාර් වෙතින් මිළදී ගැනීමට තීරණය කරන ලදී.

09:08 **තානායම අළුත්වැඩියාව සඳහා පිගන් ගඩොල් මිළදි ගැනීම**

| අයිතමය | රෝයල් සෙරමික් | සරණි පික්චර් පැලස් | සේනානී හාඩ්වෙයාර් | දේශානී හාඩ්වෙයාර් | ෆයිරූස් හාඩ්වෙයාර් |
|---|---|---|---|---|---|
| 12"x12" 2/2 3M/Floor Tile 01 | 107.14 | 127.00 | 130.00 | 133.00 | 132.00 |
| 12"x12" C 2 /36 M Floor Tile 01 | 108.93 | 129.00 | 132.00 | 135.00 | 134.00 |
| 8"x8' C2 /36 M Floor Tile o1 | 52.68 | 76.00 | 77.00 | 84'00 | 75.00 |
| 8"x8" C 2/23M Floor Tile 01 | 52.68 | 76.00 | 77.00 | 84.00 | 75.00 |
| 16"x16" C 2/22 G Floor Tile 01 | 194.00 | 242.00 | 239.00 | 240.00 | 235.00 |
| 12"x12" Tq/SE 7 Floor Tile 01 | 151.79 | 184.00 | 178.00 | 180.00 | 176.00 |
| 12"x12" Tq/7E /Porcelain Floor Tile 01 | 129.46 | 160.00 | 157.00 | 159.00 | 154.00 |
| 12"x12" 3/706 Tq/SE 7 Floor Tile 01 | 126.79 | 158.00 | 154.00 | 155.00 | 153.00 |

අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති රෝයල් සෙරමික් ආයතනයෙන් අදාල Floor Tile ප්‍රමාණයන් ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:09 **සභා ගර්භය සකස් කිරීම :**

බළන්ගොඩ නගර සභාවේ සභා ගර්භය වීදුරු ආවරණ යොදා සකස් කිරීම සඳහා කැඳවන ලද මිළ ගණන් පහත දැක්වේ.

| ආයතනය | ඉදිරිපත් කල මිළ ගණන |
|---|---|
| 01. ජගත් වැල්ඩර්ස් , බාන්ස් රත්වත්ත මාවත , බළන්ගොඩ | රු.170,000.00 |
| 02.එම්. මධුශානී එන්ටර්ප්‍රයිසස් බළන්ගොඩ | රු.165,000.00 |
| 03.සෙවන ග්ලාස් හවුස් , තුඹගොඩ,බලන්ගොඩ | රු.154290.50 |

අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති සෙවන ග්ලාස් හවුස් ආයතනයෙන් අදාල කාර්යය ඉටුකරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:10 **විදී පහන් නඩත්තුව සඳහා ද්‍රව්‍ය ලබාගැනීම**

විදී පහන් නඩත්තුව සඳහා අවශ්‍ය කරන පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා කැඳ වූ මිළ ගණන් පහත දැක්වේ.

| | ලාස්ට් චාන්ස් ලයිටින්ග් | රිමාස් ඉලෙක්ට්‍රික ල්ස් ඇන්ඩ් ලයිටින්ග් | ආර්.එස්.ඉලෙක්ට්‍රි කල්ස් ඇන්ඩ් ලයිටින්ග් | ජනතා හාඩ්වෙයාර් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස් | පතිරණ ඉලෙක්ට්‍රිකල්ස් |
|---|---|---|---|---|---|
| S/L ෆිටින් සෙට් | 1450.00 | 1525.00 | 1550.00 | 1600.00 | 2000.00 |
| 100 w සාමාන්‍ය විදුලි බුබුළු | 49.00 | 52.50 | 490.50 | 51.50 | 60.00 |
| 20 w CFL බල්බ් | 480/- | 495.00 | 550.50 | 487.50 | 490.00 |

අවම මිළ ඉදිරිපත් කර ඇති " ලාස්ට් චාන්ස් ලයිටින්ග් " වෙතින් අදාල ද්‍රව්‍ය මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

- **කසල ඉවත් කිරිමේ හා ප්‍රවාහනය කිරිමේ ලංසු සේවාව සඳහා කම්කරුවන් සැපයීමේ ලංසු කැඳවීම:**

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශය තුළ කසල ඉවත් කිරීමේ හා ප්‍රවාහනය කිරීමේ සේවාව සඳහා කම්කරුවන් සැපයීමට ලංසු කැඳවා තිබූ අතර , අදාළ ලංසුපත් විවෘත කිරීම 10.30 ට සිදුකරන ලදී. , ලැබී තිබූ ලංසුපත පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

බළන්ගොඩ ,රාස්සගල පාර අංක:63/3 , යන ලිපිනයේ පදිංචි බී.ගුණරත්න යන අය පමණක් රු .201166.66 /- ක ලංසුපතක් ඉදිරිපත් කර තිබුණු අතර, සභාව විසින් එම ලංසුපත පිළිගන්නා ලද අතර, 2009.10.01 දින සිට දින 2010.09.30 දක්වා අදාල සේවාව පවත්වාගෙන යාමට අවසර ලබාදීමට සභාව තීරණය කරන ලදී.

10. **යෝජනා :**

10:01

**ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා :**

1. කියවීම් මාසය වෙනුවෙන් යෝජිත මහිමය ii සඟරාව මුද්‍රණය කිරිම සඳහා රු.25,000/- ක් වෙන් කිරීම.

ii. බළන්ගොඩ මහජන ක්‍රීඩාපිටිය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීම :-

දැනට බළන්ගොඩ ක්‍රීඩාපිටියේ ඉඩමෙන් කොටසක් සඳහා පෞද්ගලික ඉඩම් හිමියෙක් අයිතිවාසිකම් ඉල්ලා අධිකරණය වෙත ගොස් ඇත. එසේ වුවත්, මෙම ඉඩම් කොටස හා ක්‍රිඩාපිටිය හා මහජන පොළ අතර ඇති ඉඩම් කොටස යන සියල්ල බළන්ගොඩ මහජන ක්‍රීඩාපිටිය සැකසීම සඳහා අවශ්‍යව පවතී.

එබැවින් , නාගරික සංවර්ධන පනතේ විධිවිධානයන් අනුව මෙම සංවර්ධන කටයුතු සඳහා අත්පත් කරගත යුතු බව යෝජනා කරමි.

iii **ජාතික සවිය ගම නැගුම -2009**

මේ රටේ යුද්ධයක් පැවති කාලය තුළද අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා , පළාත් පාලන ආයතන ශක්තිමක් කිරීම සඳහා ජාතික සවිය,ගම නැගුම,මග නැගුම වැනි ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවූ බවත්, ඒ සම්බන්ධව සිය කෘතවේදීතාව අතිගරු ජනාධිපතිතුමන් වෙත පළකරන බව ගරු සභාපතිතුමා පැවසීය. තව දුරටත් කථා කල ගරු සභාපතිතුමා , උක්ත වැඩ සටහනේ පළමු අදියර සඳහා ව්‍යාපෘතීන් වෙන්කර ගැනීමේ දී මෙම සභාවට අයත් වසම් සියල්ලම ආවරණය වන පරිද්දෙන් හා මන්ත්‍රීවරුන් සියළු දෙනා අතර බෙදී යන ආකාරයට ව්‍යාපෘති ලබාදෙන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීම් කලද මෙම සභාව වෙත සංවර්ධන ව්‍යාපෘති 03 සඳහා පමණක් අනුමැතිය ලැබුණු බවත් ඒ සම්බන්ධව සිය කණගාටුව ප්‍රකාශ කරන ලදී. මෙම වැඩ සටහනේ පළමු අදියරේ වැඩ කටයුතු මෙම සභාව විසින් සාර්ථකව

නිම කල අතර, ii අදියරේ වැඩ ආරම්භ කිරිම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අවසර ඉල්ලූ අතර, බළන්ගොඩ ප්‍රාදේශීය සභාව පළමු අදියරේ වැඩ කටයුතු මෙතෙක් නිම නොකිරීම නිසා ii අදියර වැඩ ආරම්භ කිරීම සඳහා අවසර ලබාදීම ප්‍රමාද කර ඇති බව පැවසීය. මෙම ව්‍යාපෘතියන් සම්බන්ධව ප්‍රාදේශීය කාර්යාලයේ නිසි අධීක්ෂණයක් නොමැතිවීම මෙම තත්ත්වය නිර්මාණය වීමට හේතු වී ඇති බැව් දැන් වූ එතුමා, මෙයින් ප්‍රදේශවාසී ජනතාව විශාල අසාධාරණයකට ලක්ව ඇති හෙයින් මෙම කාරණය අදාල බලධාරීන්ගේ අවධානයට ලක්කිරීම සුදුසු යැයි යෝජනා කරන ලදී.

iv. සරස්වතීවත්ත පාර සුසාන භූමිය අසලින් ඉහල අවසාන කොටස සංවර්ධනය කිරීම හා කරවිකැටිය ගල්වල පාර ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

v.ගරු පේෂකර්ම අමාත්‍ය, මහින්ද රත්නතිලක මැතිතුමාගේ ප්‍රතිපාදන වලින් ක්‍රීඩාපිටි සංවර්ධනය සඳහා රු.120000/- ක මුදලක් ලැබී ඇති බැවින් , එම මුදලින් බෝම්බුව වතුකාරගොඩ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමටත් , එහි ඉතිරි වැඩ කටයුතු සඳහා සභාවෙන් මුදල් යොදවා සභා කර්මාන්තයක් ලෙස නිමකිරීමටත් යෝජනා කරන ලදී.

vii. සභා ගර්භය හා සභාපති නිල කාමරය සඳහා පහත සඳහන් උපකරණ මිළදී ගැනීමට යෝජනා කරන ලදී.

| | | |
|---|---|---|
| 01. | විධායක මේස | 01 |
| 02. | විධායක පුටු ( High Back ) | 01 |
| 03. | අත් ඇදි සහිත පුටු ( Visiter Chair ) | 02 |
| 04. | අත් ඇදි සහිත පුටු (low Back Chair ) | 10 |
| 05. | මෙලමයින් කබඩ් | 01 |
| 06. | සාකච්ඡා මේස | 01 |
| 07. | මෙලමයින් ලාච්චු ( රෝද සවිකර ඇති ) | 01 |
| 08. | පරිගණක මේස | 02 |
| 10. | අත් ඇදි සහිත පුටු ( ටයිපිස්ට් චෙයාර් ) | 05 |
| 12. | ඇන්ද සහිත දේශන ශාලා පුටු | 03 |
| 13. | ඇන්ද රහිත දේශන ශාලා පුටු | 10 |
| 14. | ඇදි පුටු | 10 |
| 15. | සෝෆා සෙට් | 01 |
| 16. | මතුපිට වීදුරු යෙදු ස්ටූල් | 01 |

ඉහත යෝජනා සියල්ල ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

viii. **කාර්යාලය නවීකරණය කිරීම :**

පළාත් සභාවෙන් ලැබී ඇති රු.ලක්ෂ 20 ක මුල්‍ය ප්‍රතිපාදන යොදාගෙන කාර්යාලය නවීකරණ කටයුතු ආරම්භ කිරීම පිණිස සභා ගර්භයක් අළුතින් සකස් කිරීම සභාපති නිල කාමරයක් අලුතින් සකස් කිරීම හා කාර්යාලයට අලුතින් මේස පුටු කබඩ් යනාදිය මිළදී ගැනීම සුදුසු යැයි ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

දැනට කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්ම/මහත්මීන් වැඩි සංඛ්‍යාවක් භාවිතා කරන පුටු මේස කබඩ් යනාදිය වර්ෂ 15 - 20 කටත් වඩා පැරණි ඒවා බැවින් භාවිතයට නුසුදුසු තරම් අබලන් වුත් , පැරණි වුත් , භාණ්ඩ භාවිතයෙන් ඉවත් කිරීමට අදාළ නීත්‍යානුකුල කටයුතු කිරීම පිණිස පහත සඳහන් සාමාජික මණ්ඩලය පත්කරන ලදී.

| | | |
|---|---|---|
| 01. වැඩ අධිකාරී | - | යු.වී.දැල බණ්ඩාර මහතා |
| 02. ප්‍රධාන කළමනාකරණ සහකාර | - | එම්.එච්.සීලවතී මිය |
| 03. වැඩ සටහන් සහකාර | - | සංජී වසන්ති මිය |
| 04. කළමනාකරණ සහකාර | - | මංගලිකා දමයන්ති මිය |
| 05. ප්‍රජා සංවර්ධන නිලධාරී | - | ආර්.එම්.ජී.බණ්ඩාර මහතා |
| 06. ප්‍රජා සංවර්ධන නිලධාරී | - | සෝමරත්න මහතා |

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර යන මන්ත්‍රීතුමන්ලා අධීක්ෂණය සඳහා පත්කරන ලදී.

භාවිතයෙන් ඉවත් කරන උපකරණ පිළිබඳව විස්තර සකස් කර ලබන මස මහ සභාවට ඉදිරිපත් කර ඒවා කල් පවත්නා භාණ්ඩ ලේඛනයෙන් ඉවත් කිරීමේ ඉදිරි කටයුතු කරන ලෙස ලේකම් මහතාට උපදෙස් දෙන ලදී.

ඉහත යෝජනා සියල්ල ඒකමතිකව සහා සම්මත විය.

10:02 **ගරු නාගරික මන්ත්‍රී , ධර්මසේන සමරසිංහ මැතිතුමා :**

බුලත්ගම සුනන්දාරාම මාවතේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමන් විසින් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී, ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභා සම්මත කරන ලදී.

10:03 **ගරු නාගරික මන්ත්‍රී, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා :**

මෙම වර්ෂයේ මග නැගුම වැඩ සටහන යටතේ මෙම සභාව මගින් කර්මාන්ත 08 ක වැඩ කටයුතු සිදුකර ඇති අතර, එම කර්මාන්ත සඳහා මුදල් ලබාගැනීමේ දී ඉදිරිපත් කල යුතු ලියකියවිලි අතර තත්ව පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම අනිවාර්යය කර ඇති අතර එය සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරු අමාත්‍යාංශයට යවා මුදල් ලබාගැනීම සිදුකරනු ලබන අතර , ඒ සඳහා වැඩි කාලයක් ගතවන අතර , එයින් කොන්ත්‍රාත්කරුවන්ට ඉදිරි සංවර්ධන කටයුතු ඉටුකරගැනිමේ මුල්‍යමය අපහසුතාවකට ලක්වන බැවින් , අමාත්‍යාංශයෙන් මුදල් ලැබීමට පෙර සභාව මගින් ඒ සඳහා මුදල් ගෙවන ලෙස යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මෙය සලකා බැලූ සභාව , විසින් මාර්ග වල තත්ව වාර්තාව සලකා බලා කර්මාන්ත වල මුදල් ප්‍රතිපූර්ණය කරගත හැකි බැවින් ගෙවීම් කිරීමට අනුමැතිය ලබාදෙන ලදී.

10:04 **ගරු නාගරික මන්ත්‍රී, එම්.ටී.එම්.රූමි මැතිතුමා :**

කුමාරගම ප්‍රදේශයේ මුස්ලිම් දහම් පාසලක් පවත්වාගෙන යන බැවින් , එයට සභා අරමුදලින් දැල් ආවරණයක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

11. **කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම :**

11:01 2009.08.26 දින හා 2009.09.10 යන දින පවත්වන ලද පුස්තකාල උපදේශක කමිටුවල වාර්තා සභාගත කරන ලදුව සභාව විසින් එම වාර්තා අනුමත කරන ලදී.

11:02 2009.09.09 දින පවත්වන ලද මුදල් කමිටුවේ වාර්තාව හා 2009.09.09 දින පවත්වන ලද කර්මාන්ත කමිටුවේ වාර්තාව සභාගත කරන ලදුව , එම කමිටු වාර්තා සභාව විසින් අනුමත කරන ලදී.

කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කර තිබූ පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබෙන පහත සඳහන් කර්මාන්ත දෙක පිළිවෙලින් තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය හා විජනත්කුඹුර විජය ග්‍රාම සංවර්ධන සමිතිය යන අනුමත සමිති දෙක හරහා සිදුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

01. බළන්ගොඩ කල්තොට පාර කුමාරගම 1 පටුමග අඩි 375 ක් සංවර්ධනය කිරීම

02. ඇල්ලෙපොල පල්ලෙකුඹුර ගල්බැම්මගොඩහේන පළමු අතුරු මාර්ගය සංවර්ධනය කිරීම.

12. **ආදායම් - වියදම් හා අනෙකුත වාර්තා ඉදිරිපත් කිරීම:**

12:01 **ආදායම් - වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම:**

2009 වර්ෂයේ අගෝස්තු මාසයට අදාළව ආදායම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 4,471,537.64 |
| වෙනත් ලැබීම් | 11,995,822.88 |
| | ----------- |
| මුළු ලැබීම් | 16,767,360.52 |
| | |
| පුනරාවර්ථන වියදම් | 2,906,200.81 |
| වෙනත් වියදම් | 9,973,721.05 |
| | ------------- |
| මුළු ගෙවීම් | 12,879,921.86 |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

12:02 2009.08.01 දින සිට 2009.08.21 දින දක්වා මෙම නගර සභාව සතු වාහන සඳහා වැය වූ ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව , එම වාර්තාව සභාව විසින් අනුමත ලදී.

13. **වෙනත් කරුණු :**

නැත

14. **අවසානයː-**

**ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාː**

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන්ටත් , ලේකම් මහතාටත් සිය ස්තුතිය ප්‍රකාශ කරමින්, සභාවේ වැඩ කටයුතු ප.ව. 02.00 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.

**යෝජනා**

**කාර්යාලය නවීකරණය කිරීම :**

පළාත් සභාවෙන් ලැබී ඇති රු.ලක්ෂ 20 ක මුල්‍ය ප්‍රතිපාදන යොදාගෙන කාර්යාලය නවීකරණ කටයුතු ආරම්භ කිරීම පිණිස සභා ගර්භයක් අළුතින් සකස් කිරීම සභාපති නිල කාමරයක්

අලුතින් සකස් කිරීම හා කාර්යාලයට අලුතින් මේස පුටු කබඩ් යනාදිය මිළදී ගැනීම සුදුසු යැයි ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

දැනට කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්ම/මහත්මීන් වැඩි සංඛ්‍යාවක් භාවිතා කරන පුටු මේස කබඩ් යනාදිය වර්ෂ 15 - 20 කටත් වඩා පැරණි ඒවා බැවින් භාවිතයට නුසුදුසු තරම් අබලන් වුත් , පැරණි වුත් , භාණ්ඩ භාවිතයෙන් ඉවත් කිරීමට අදාළ නීත්‍යානුකුල කටයුතු කිරීම පිණිස පහත සඳහන් සාමාජික මණ්ඩලය පත්කරන ලදී.

| | | |
|---|---|---|
| 01. වැඩ අධිකාරී | - | යු.වී.දැල බණ්ඩාර මහතා |
| 02. ප්‍රධාන කළමනාකරණ සහකාර | - | එම්.එච්.සීලවතී මිය |
| 03. වැඩ සටහන් සහකාර | - | සංජී වසන්ති මිය |
| 04. කළමනාකරණ සහකාර | - | මංගලිකා දමයන්ති මිය |
| 05. ප්‍රජා සංවර්ධන නිලධාරී | - | ආර්.එම්.ජී.බණ්ඩාර මහතා |
| 06. ප්‍රජා සංවර්ධන නිලධාරී | - | සෝමරත්න මහතා |

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර යන මන්ත්‍රීතුමන්ලා අධීක්ෂණය සඳහා පත්කරන ලදී.

භාවිතයෙන් ඉවත් කරන උපකරණ පිළිබඳව විස්තර සකස් කර ලබන මස මහ සභාවට ඉදිරිපත් කර ඒවා කල් පවත්නා භාණ්ඩ ලේඛනයෙන් ඉවත් කිරීමේ ඉදිරි කටයුතු කරන ලෙස ලේකම් මහතාට උපදෙස් දෙන ලදී.

- **විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ප්‍රදානය- 2006/2007,2007/2008**

බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ 2006/2007 , 2007/2008 අධ්‍යයන වර්ෂ වල විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයින් තෝරා සභා අරමුදලින් රු.5000/- ක ශිෂ්‍යත්වයක් ප්‍රදානය කිරීමට කටයුතු සංවිධානය කර ඇති බැවින් , ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින සියළු දෙනා ගරු සභාපතිතුමා විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.ඉන් අනතුරුව අදහස් දැක් වූ එතුමා , මෙම නගර සභාව බදු ගෙවන ජනතාව වෙනුවෙන් සුවිශේෂී වූ සේවාවන් රැසක් ඉටුකරනු ලබන අතර, මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය ද මෙම සභාව විසින් ඉටුකරනු ලබන තවත් එක් ප්‍රජා සේවාවක් ලෙස සැලකිය හැකි බව දැන්වීය. වර්තමානයේ පවතින ආර්ථිකයත් සමඟ මෙම මුදල ශිෂ්‍යත්වලාභියෙකුට සිය ගමන් වියදම සඳහාවත් ප්‍රමාණවත් නොවන බවත් , නමුත් මෙවැනි ප්‍රදානයන් තුළින් දරුවන් අධ්‍යාපන කටයුතු වලට දිරිගැන්වීම මෙම සභාවේ අරමුණ බව පැවසීය.

බළන්ගොඩ නගර සභාව දරුවන්ගේ මූළික අධ්‍යාපනය නගා සිටුවීම සඳහා ද දායකත්වයක් ලබාදෙන අතර, පාඨකයින්ගේ කියවීම රුචිය සහ දැනුම වර්ධනය සඳහා මහජන පුස්තකාලයක් පවත්වාගෙන යන අතර , ඊට අනුබද්ධව නව බස්නැවතුම්පලට ආසන්නයේ කියවීම් ශාලාවක් හා විදුණැන පියස නමින් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් ආරම්භ කර ඇති බව පැවසීය. ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීම සඳහා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවක් ද පවත්වාගෙන යනු ලබන අතර , පුරවැසි කමිටු හරහා ලබාගන්නා යෝජනා තුළින් ග්‍රාම සේවක කොට්ඨාස වල අඩුපාඩු සකස් කිරීම සිදුකරනු ලබන බව දැන්වීය. වැසිකිලි පහසුකම් නොමැති අයට සභා අරමුදලින් වැසිකිලි තැනීම සඳහා ද ආධාර ලබාදීමේ කාර්යය මේ දක්වා ඉටුකරනු ලැබූ අතර, මෙවර අයවැය මගින් නිවසක් නොමැති අයෙකුට නිවසක් තැනීමට ද මුදල් ප්‍රතිපාදන වෙන්කර ඇති බැවින් ඉදිරියේ දී එම කාර්යය ඉටුකරදීමට ද ක්‍රියාකරන බව පැවසීය.

තමා 1996 වර්ෂයේ මෙම සභාවේ සභාපති ලෙස පත් වූ අතර , එම වර්ෂය තුළ ආරම්භ කල මෙම ශිෂ්‍යත්ව ලබාදීමේ කාර්ය වසර 04 ක පමණ කලක් එනම් , මෙම සභාව එක්සත් ජාතික පක්ෂයේ පාලන බලයට යත්ව තිබූ අවධියේ නතර වී තිබුණු අතර , නැවතත් තමා මෙම සභාවේ සභාපති ලෙස පත් වූ බැවින් යළිත් මෙම ශිෂ්‍යත්ව ලබාදීමේ කාර්යය ආරම්භ කල බව

පවසමින් මෙම දරුවන්ට සිය අධ්‍යාපන කටයුතු සාර්ථකව නිම කර රටට/ප්‍රදේශයට වැඩදායී පුරවැසියන් වීමට ශක්තිය ධෛර්ය ලැබේවා යි සුභාශිංසනය කරමින් සිය අදහස් දැක්වීම නිම කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී, එම්.ටී.එම්.රූමි මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා අදහස් දක්වමින් , තමා රජයේ පාසල ගුරුවරයෙකු ලෙස සේවය කරන අතර , තමාගෙන් අධ්‍යාපන ලැබූ දරුවන් දෙදෙනෙකු ද විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබාගැනීම සඳහා මෙම අවස්ථාවට සහභාගීවී සිටීම තමාට විශාල සතුටක් බව පැවසීය. දේශපාලන, ආගම් බේදයකින් තොරව , නගර සභා බලප්‍රදේශය තුල විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ දරුවන් තෝරා මෙම ප්‍රදානය සිදුකිරීම ඉතාමත් අගය කරන අතර ,ඒ සම්බන්ධව සිය ප්‍රණාමය මෙම සභාවේ ගරු සභාපතිතුමන්ට පළකරන කරන අතර , මෙම සභාව විසින් පළුදායී හා ගුණාත්මක සේවාවන් රැසක් ඉටුකරනු ලබන බව සඳහන් කල අතර , එම කාර්යය ඉටුකරලීමට හොඳ නායකත්වය ලැබී තිබීම සියළු දෙනාගේ භාග්‍යයක් වන බව පවසමින් , මෙම දරුවන්ට සුභ පැතුම් එක් කරමින් සිය කථාව නිම කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී , ධර්මසේන සමරසිංහ මැතිතුමා :**

විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබූ මෙම ප්‍රදේශයට " මිණි කැට " වන් වූ මෙම සිසු දරු දැරියන්ට බළන්ගොඩ නගරයේ බදු ගෙවන ජනතාවගේ බදු මුදලින් ලැබෙන ප්‍රතිලාභයක් ලෙස මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය හැඳින්විය හැකි බවත්, මෙම ප්‍රතිලාභයට අමතරව වෙනත් ප්‍රතිලාභ රැසක් ජනතාව අතර බෙදී යන බව පැහැදිලි කරමින් , මෙම දරුවන්ට සිය අධ්‍යාපන කටයුතු ඉතාමත් සාර්ථකව කරගෙන යාමට ශක්තිය හා ධෛර්ය ලැබේවා යි සුභ ප්‍රාර්ථනය කරන ලදී.

- ශිෂ්‍යත්වලාභියෙකු අදහස් දක්වමින් , බළන්ගොඩ නගර සභාව විසින් සිදුකල මෙම සත්කාර්යයට ශිෂ්‍යත්වලාභීන් වෙනුවෙන් සිය ගෞරවය පිරිනමන බව දැන්වීය. මෙම නගර සභාව විසින් මහජනතාවගේ යහපත ඉටුකරනු ලබන කාර්ය භාරය අගය කරන බව දැන් වූ අතර , එම සේවාවන් අතරින් විශේෂයෙන් බළන්ගොඩ මහජන පුස්තකාලය ප්‍රදේශයේ දරුවන්ට සිය අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීමට වටිනා සම්පත් බව සඳහන් සිය අදහස් දැක්වීම නිම කරන ලදී.
- ගරු සභාපතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා විසින් පහත සඳහන් ශිෂ්‍යත්වලාභීන් වෙත රු.5000/- බැගින් ශිෂ්‍යත්ව පිරිනැමීම සිදුකරන ලදී.

01. රංගන විමුක්ති මීගස්දෙණිය
02. එච්.පී.විශාකා පියුමලී
03. ජේ.එම්.උදේශිකා පුෂ්ප කුමාරි ජයසිංහ
04. ඩී.එම්.සඳුලි දිලේෂා දියගම
05. ඒ.එච්.අසංක ලක්මාල්
06. මොහොමඩ් ගනී ශකීර් අහමඩ්
07. කාන්චනා සජානී සිසිල්
08. සිංගාරවේල් කරුන්යා
09. එම්.වින්ද්‍යා කාන්ති
10. ටී.ජී.නිරෝෂනී ලක්මාලී